## මක්ෂිම් ගෝර්කි ගේ මහා නවකතාව



# අම්මා

සිංහලට නඟන්නේ
**දොස්තර කීර්ති කුලසේකර**
(MBBS Mphil PhD)
ල වරෝබ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය සහ
බෙන්ඩිගෝ මූලික රෝහලේ වෛද්‍ය නිලධාරී.

**සුමිත් පෙරේරා ගේ සිතුවමින්**

# බීමතින් ගෙදර ආ පුතා

"මම මාළු බාන්න වත් යන්න ඕනේ.. එක්කෝ දඩයමේ යන්න තුවක්කුවක් වත් ගත්තා නම් හරි"

පාවෙල් පිළිතුරු දුන්නේ මේ ඒකාකාරී ජීවන රටාවෙන් ඔබ්බට යමක් සොයන්නට ඇති අවශ්‍යතාවය තම මවට හඟවමිනි.

පාවෙල් ක්‍රියාශීලිව සහ අවංකව සේවය කළේය. ඒ කිසි විවේකයක් නොමැතිව වුවත් කම්මල් හිමියන්ගේ උදහසටද ලක් නොවෙන ආකාරයෙනි.

අනෙකුත් බොහෝ සේවයකන්ට ලදඩුවම් හෝ දඩ ල හිමි වුවද පාවෙල් අකුරට සේවය කල නිසා ඔහුට එවැන්නක් සිදු වුයේ නැත.

අනෙක් සේවකයන් මෙන් කයිවාරු නොගැසූ පාවෙල් ඉතා නිහඬ චරිතයක් විය. මවගේ මින් ඉදිරියට නෙරූ නිල් පැහැති විශාල දෑස් අසතුටකින් පිරී තිබිණි. මොරගෙඩි වැනි දෑස් ඈත බැලූවේ අසන්තෘප්ත බැල්මක් සහිතවයි.

තදබල පසු තැවිමකින් පසුවන්නේකුගේ මුහුණුවර ඔහුගෙන් පෙනෙන්නට විය.

මුල් කාලයේ බොහෝ නිවාඩු දිනවල ඔහුගේ මිතුරන් ඔහු සොයාගෙන නිවසට ආහ. ඒ ප්‍රිය සාදයකට හෝ මත්පැන් බීමට පාවෙල් කැඳවාගෙනයන අටියෙනි. එහෙත් කවදාවත් පාවෙල් නිවසේ නැති බව දුටු ඔවුන් කල්යත්ම තම මිතුරා සොයා ඒම නවතා දැමුහ.

තම ආදරණීය පුත්‍රයා ගමේ කම්මලේ අනෙක් කොල්ලන්ට වඩා වෙනස් ආකාරයකට හැඩ ගැහෙන අයුරු දුටු අම්මා ඒ ගැන බෙහෙවින් සතුටු වූවාය. එහෙත් ඈ කිසියම් වික්ෂිප්ත භාවයකට පත් වීමට හේතුවක් වුයේ ඔහු සාමාන්‍ය ජීවන රටාවෙන් සම්පූර්නයෙන්ම ඔබ්බට ගොස් යම් තරමකට සැඟවුණු සහ නිහඬ ජීවන රටාවකට යොමුවීමයි.

ඔහුගේ මේ වමටත් නැති දකුණටත් නැති හැසිරීම් රටාව ඈ සිත බෙහෙවින් දෙගිඩියාවකට පත් කරන්නට හේතුවක් විය.



පාවෙල් තුවක්කුවක් මිලදී ගත්තේ නැත. ඔහු මාළු බාන්න ගියේද නැත. එහෙත් ඔහු අනෙකුත් හැමෝම ගිය ඒකාකාරී ඔද්දල් වූ මාවතෙන් ක්‍රහමානුකුලව ඉවත් වුයේය.

## අසාමාන්‍ය වෙනස් වීම.

ඔහුගේ සාද හෝ ප්‍රීසම්භාෂණ වලට සහභාගී වීම් එන්න එන්නම අඩු විය. කලාතුරකින් සති අන්තයක ඔහු එළියට ගියේ වුවද ඔහු නිවසට ලඟා වෙද්දී කිසිදු මත්පැන් ගඳක් ඔහුගෙන් වහනය වුයේ නැත.

ඔහුගේ මව ඉතා සමීපව එහෙත් පාවෙල්ට හාන්කවිසියක් වත් නොදැනෙන පරිද්දෙන් ඔහුව නිරීක්ෂණය කළාය.

තම පුතුගේ කහ පැහැති දිගටි මුහුණ එන්න එන්නම උනන්දුවෙන් වර්ධනය වන ආකාරයත් ඔහුගේ දීප්තිමත් දෑස් දිගින් දිගටම අධිෂ්ඨානයෙන් පිරෙනඅයුරුත් ඇය දුටුවාය.

ඔහුගේ දෙතොල් ලාක්ෂණික අයුරකින් තද වන සැටිත් ඒවා ඔහුගේ මුහුණේ ඉරියව් වලට යම් අසාමාන්‍යෂ ගාම්භීර බවක් එක් කරන සැටිත් අම්මා නිරීක්ෂ ණය කල අනෙක් ලක්ෂණ විය.

පාවෙල් කිසියම් දෙයක් ගැන තද කේන්තියකින් පසුවන අයුරක් පෙනෙන්නට තිබිණි . එසේම මෙසේ ටික කලක් ගෙවී ගියේය. ඔහු නිවසට පොත් පත් රැගෙන එන්නට පටන් ගත්තේය. මුලින් මුලින් තමා කියවන පොත් පත් අම්මාගෙන් වසන් කර තබන්නට පුරුදු වූ හෙතෙම විටෙක කියවීමෙන් පසු ඒවා සඟවා තැබුවේය.

තවත් වරෙක තමා කියවූ ඡේදයක් කඩදාසියක සටහන් කල පාවෙල් අනතුරුව එයත් සඟවා තැබුවේය.

"උඹට මොකක් හරි අසනීපයක් වත්ද.. පව්ලූෂා ?" අම්මා වරක් ඔහුගෙන් විමසා සිටියාය .
"මට ඇති ලෙඩක් නෑ.."

"උඹ හරියට කෙට්ටු වෙලා මයේ පුතේ .. හරියට කටුස්සෝ කාපු බැලලියක් වාගේ"

පාවෙල් දැඩි නිහඬ තාවයකින් පසුවූවා මිස අම්මාගේ අදහස් දැක්වීමට ප්‍රගතිචාර දැක්වුයේ නැත. ඇත්තටම ඒ දිනවල ඔවුන් එකිනෙකා හා කතා බහ කෙරුවේ ඉතාම අඩුවෙනි.

එමෙන්ම අම්මා සහ පුතා මුණ ගැසෙන අවස්ථාද ක්‍ර ම ක්‍ර මයෙන් අඩු වී ගියේය . උදේ පාන්දර අම්මා වත් කර දුන් තේ කෝප්පය කිසි කතාවක් බහක් නැතිව බිව් පාවෙල් උදෙන්ම වැඩට පිටත් වුයේය.

එහෙත් ඔහු කම්මලේ වැඩ කරන අතර දහවල් කෑමට නිවසට එන්නට පුරුදු වී සිටියේය. දහවල් කෑම කන අතර එහෙන් මෙහෙන් වචනයක් දෙකක් හුවමාරු වුවද දිගු කතා බහක් කෙරුණේ ඉතාම අඩුවෙනි.

දහවල් කෑම එක කටට දෙකට ගිලදමන ඔහු හවස් වනතෙක් නැවතත් අතුරුදහන් වෙයි. එසේ අතුරුදහන් වන පාවෙල් රෑට රෑ වී ගෙදරට ලඟා වන්නේ කිසි කතාබහක් නොමැතිවයි.

දවසේ වැඩ නිමා කර ගෙට ගොඩවෙන පාවෙල් මුලින්ම ඇඟපත සෝදා ගනියි. රාත්‍රි ආහාර අනුභවය අවසන්වීමත් සමගම ඔහු තම කාමරයට රිංගා ගනියි. ඒ ඔහුගේ කාමරය පුරවා ඇති පොත් ගොන්න අතරට වැටීමටයි. රෑ බෝ වනතුරු පොත් කියවීම එකල ඔහුගේ දින චර්යාවේ ප්‍රධාන අංගයක් විය.

නිවාඩු දිනවල උදේ පාන්දරින්ම නිවසින් පිටවන ඔහු නැවත නිවසට පැමිණෙන්නේ රාත්‍රී දෙගොඩහරි ජාමයටයි.

ඔහු නගරයට හා එහි තිබු රඟහල වෙත ගිය බව අම්මා දැන සිටියාය. එහෙත් නගරයේ සිට කිසිවෙකු කවර දාකවත් ඔහු මුණ ගැසීමට යැයි කියා ගමට ආවේ නැත.

කාලය ගෙවී යත්ම තම පුතු කථා කරන ප්‍රමාණය එන්න එන්නම අඩුවන බව ඇයට දැනෙන්නට විය. ඒ හා සමගාමීව ඔහු විසින් ඇයට නොතේරෙන වර්ගයේ වචන මාළාවක් භාවිත කරන්නට පටන් ගැනීමද සිදුවිය.

ඒ ඉතා කලාතුරකින් වුවද කල්යත්ම ඔහුගේ මේ නව වාග් මාළාවේ භාවිතාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වන්නට විය. රළු පරළු සහ දෙපැත්ත කැපෙන වර්ගයේ වචන ඔහුගේ භාවිතයෙන් ගිලිහී යන අයුරු අම්මා නිරීක්ෂණය කලාය.

ඔහුගේ එදිනෙදා හැසිරීමේ සිදුවූ සමහර වෙනස් කම් අම්මා මත බලපෑමක් විශාල බලපෑමක් ඇතිකළේ ඇයගේ නොමඳ අවධානය ඒ වෙත යොමුකරවමිනි.

ඔහු ජීජේත්තුවට අදින පළඳින එක නවතා දැමීය. එහෙත් තම ඇඳුමේ සහ සිරුරේ පිරිසිදු භාවය ගැන වැඩි අවධානයක් යොමු කළේය. ඔහුගේ ගමන බිමනද ක්‍රියාශීලි සහ නිදහස් බවක් පෙන්නුම් කළේය. දිනෙන් දින වැඩිවන ඔහුගේ මේ සරළ සුනම්යද බව අම්මා ගේ නොමඳ ආකර්ෂණයට හේතුවක් විය.

වරෙක විශාල පිංතූරයක් ගෙදර ගෙනා පාවෙල් එය බිත්තියේ එල්ලූවේය. එහි සිටියේ මිනිසුන් තිදෙනෙකි . ඔවුන් සතුටු සාමිචියේ යෙදෙමින් සැහැල්ලු ගමනක යෙදී සිටින අයුරක් එහි සටහන් වී තිබිණි.

"මේ මරණයෙන් නැගිටපු යේසුස් ක්‍රියස්තුස් ඔහුගේ ගෝලයනුත් සමග ලඑමුස් ල වලට යන ගමන් ..." පාවෙල් පැහැදිලි කළේය.

අම්මා පිංතූරයට දැඩිසේ ප්‍රිවය කළාය . එහෙත් ඒ අතරම මෙවැනි සිතුවිල්ලක් ඈ තුල පැන නැගුනාය.

"ඔයා කවදාවත් පල්ලිටය යන්නේ නෑ...එත් .. ක්‍රි ස්තුස් ට ගරු කරනවා ..??"

එතැන් පටන් තව තවත් පිංතුර වලින් ගෙයි බිත්ති සැරසෙන්නට විය. ගෙදරට පැමිණි පොත් ගණනද එන්න එන්නම වැඩි වුයේ ඔහුගේ හිතවත් වඩු බාස් ලා හදා දුන් පොත් රාක්ක පුරවමිනි.

කොටින්ම කියතොත් ඔවුන්ගේ වාසස්ථානය නිවසක් බවට පත්වන ලකුණු පෙන්නුම් කළේය.
ඔහු තම මව ඇමතුවේ "ඔබ" යන බහුවචනය ගරු නාමයක් ලෙස යොදා ගනිමිනි.

තවද "මමා" යන සුරතල් නාමය වෙනුවට කටපුරා කිව හැකි ලඅම්මාල යන වචනය සිය ආදරණීය මව අමතන්නට යොදා ගත්තේය. එහෙත් සමහරක් අවස්ථා වල සිය මව වෙත එක් වරම හැරෙන පාවෙල් "මමා" යන සරළ ඒක වචනය භාවිතා කළේ

"මමා අද මම ගොඩක් රෑ වෙලා ගෙදර ආවොත් ඕනෑවට වඩා කළ බල වෙන්නේ එහෙම නෑ ඔන්න ." කියමිනි. මේ යෙදුම් ඇය ප්‍රීතියට පත් කළාය. ඒ වචන වල කිසියම් නිශ්චිත බවක් මෙන්ම ස්ථිර සාර බවක් ගැබ්වී ඇති බව දුටු ඇය තව තවත් සතුටට පත් වූවාය.

එහෙත් ඇයගේ සිත තුල කැකෑරෙමින් තිබු අපහසුතාව ටිකෙන් ටික වැඩි වෙන්නට විය.
සිය පුතුගේ මේ වෙනස් වීම කාලානුරූපිව පැහැදිලි නොකෙරුණ බැවින් ඇයගේ හදවතේ කිසියම් තිගැස්මක් ඇතිවූවා යැයි කිවහොත් නිවැරදිය.

ඒ කුමක්හෝ අසාමාන්‍ය සිදුවන්නේ දැයි ඒ හදවතේ ඇතිවූ නිරන්තර ගැටළු නිසාය.
ඈ සිත තුල තම පුතු ගැන යම් අසහනකාරී සිතුවිල්ලක් ඇති වුයේ මෙවැනි අවස්ථාවකදීය.

"ගමේ අනික් හැම කොල්ලෙක්ම කොල්ලෝ වගේ ජිවත් වෙනවා"

"මෙයා හාමුදුරු කෙනෙක් වගේ නේ ?"
"හරි තැන්පත් .. විනයානුකූලයි .."
"එයාගේ වයසට නෙවෙයි" තවත් වරෙක ඈ මෙසේ සිතුවාය.

"නෑ.. නෑ.. මෙයා පල්ලැහැ ගමේ කෙල්ලෙක් ගැන වත් හිතනවා ඇති ... නරක වයසනේ ?" එහෙත් කෙල්ලන් සමග ගැවසීමට නම් මුදල් අවශ්‍යපය.

පාවෙල් තමා හම්බ කල හැම සතයක්ම මාසේ අන්තිමට අම්මා අත තැබුවේය.

දින , සති මාස ගණන් මේ ලෙස ගෙවී ගියේය. ඇඟට පතට නොදැනී වසර දෙකක්ම ගත වී ගොසිනි . නිහඬ , නිසල එහෙත් සැකෙන් හා සංකාවෙන් ගතවුණ වසර දෙකක් අවසාන විය.

එහෙත් අම්මාගේ සිත තුල ඇති වූ සැක මුසු බිය නම් ඒ වසර දෙක පුරාම එන්න එන්නම වැඩි වුවා මිස අඩුවක් නම් නොවිය.

**මතු සම්බන්ධයි**